ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය
Business & Accounting Studies

**81 S I**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) තරග විභාගය 2006 ජූලි
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2006 டிசெம்பர்
Genaral Certificate of Education (Ord. Level) Examination, July 2006

**ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I**
**வணிகக் கல்வியும் கணக்கீடும் I**
**Business and Accounting Studies I**

පැය එකයි
*One hour*

සැලකිය යුතුය :
(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
(ii) 1 සිට 40 තෙක් ප්‍රශ්න වල දී ඇති (1), (2), (3), (4) පිළිතුරු වලින් නිවරැදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ගන්න.
(iii) ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් පිළිතුරට අදාල අංකය හා සැසඳෙන කවය මත (X) ලකුණ යොදන්න.
(iv) එම උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද පරිස්සමෙන් කියවන්න.

---

01. නිෂ්පාදනයේ මූලික අරමුණ වන්නේ,
1. භාණ්ඩ වලට භාණ්ඩ හුවමාරු කිරීමයි.
2. වෙළෙඳ පොළේ ස්ථාවරත්වයක් ඇති කිරීමයි.
3. මිනිස් අවශ්‍යතා සපුරාලීමට කටයුතු කිරීමයි.
4. භාණ්ඩ ප්‍රවාහනය කිරීමයි.

02. වෙළෙඳාම නමින් හඳුන්වනු ලබන්නේ,
1. භාණ්ඩ මුදලට අලෙවි කිරීමයි.
2. භාණ්ඩ හුවමාරු කිරීමයි.
3. භාණ්ඩ වල අයිතිය වෙනස් වීමයි.
4. භාණ්ඩ ණයට අලෙවි කිරීමයි.

03. පහසු භාණ්ඩයකි.
1. පාන්
2. පාවහන්
3. යන්ත්‍ර
4. ඇඳුම්

04. මුදලේ කාර්යයක් නොවන්නේ,
1. හුවමාරු මාධ්‍යයක් වීම
2. වටිනාකම මැනීමේ මිම්මක් වීම.
3. පොදු පිළිගැනීමක් තිබීම.
4. විලම්භිත ගෙවුම් ක්‍රමයක් වීම.

05. ව්‍යාපාරයක සාමාජීය වගකීමකි.
1. කොටස්කරුවන්ට ප්‍රතිලාභ ලබාදීම.
2. සේවකයින්ට සාධාරණ වැටුප් ගෙවීම.
3. පරිසරය සුරකීම.
4. ව්‍යාපාරය පුළුල් කිරීම.

06. භාණ්ඩ හුවමාරු ක්‍රමයේ තිබූ ප්‍රධාන දුර්වලතාවය,
1. ගෙනයාමේ අපහසුව
2. වෙළෙඳ පොළක් නැතිවීම.
3. වටිනා ද්‍රව්‍යයක් භාවිත නොකිරීම.
4. වටිනාකම මැනීමේ අපහසුව.

07. සමුපකාරයක හිමිකාරීත්වය ලබන්නේ,
1. කොටස් හිමියන්
2. සාමාජිකත්වය දරන ගනුදෙනුකරුවන්.
3. රජය
4. අධ්‍යක්ෂ මණ්ඩලය

08. තොග වෙළෙන්දාගේ කාර්යයකි.
1. භාණ්ඩ තොග වශයෙන් අලෙවි කිරීම.
2. සිල්ලර වෙළෙඳුන්ට හා නිෂ්පාදකයින්ට අවශ්‍ය උපදෙස් දීම.
3. භාණ්ඩ ගෙන ගොස් භාර දීම.
4. ඉහත සඳහන් සියල්ලම.

09. රක්ෂණය ව්‍යාපාරිකයින්ට වැදගත් වන්නේ,
1. හානිපූරණය කරගත හැකි හෙයිනි.
2. අවදානම වලක්වා ගත හැකි හෙයිනි.
3. දේපලවලට ආරක්ෂාවක් සලසන බැවිනි.
4. හානියක් සිදුවුවත් නැතත් ගෙවූ වාරික මුදල් ආපසු ලබා ගත හැකි බැවිනි.

10. පෞද්ගලික සමාගමක අවම හා උපරිම කොටස්කරුවන්ගේ සංඛ්‍යාව,
   1. අවමය 2 උපරිමය 50
   2. අවමය 7 උපරිමය සීමාවක් නැත.
   3. අවමය 2 උපරිමය 20
   4. අවමය 7 උපරිමය 50

11. කොටස්කරුවන්ගේ අයිතිය පුළුල් කිරීමේ පරමාර්ථයෙන් ආරම්භ කරන ලද ව්‍යාපාර සංවිධාන වර්ගයකි.
   1. හවුල් ව්‍යාපාර
   2. පොදු සමාගම්
   3. ජනතා සමාගම්
   4. පෞද්ගලික සමාගම්

12. ආනයනකරුගේ කාර්යයක් නොවන්නේ,
   1. ඉන්ඩෙන්ටුව පිළියෙල කිරීම.
   2. නෞභාරපත යැවීම.
   3. ණයවර ලිපි විවෘත කිරීම.
   4. රේගු හා ආනයන තීරු ගාස්තු ගෙවීම.

13. ණයට විකුණන භාණ්ඩ පිළිබඳ විස්තර දක්වමින් විකුණුම්කරු විසින් ගැණුම්කරු වෙත එවන ලියවිල්ලකි.
   1. ලදුපත
   2. ඉන්වොයිසිය.
   3. හරපත
   4. බැරපත

14. විවෘත වෙළෙඳ පොළ තුලදී තාර්කික භාරිභෝගිකයකු කළ යුත්තේ,
   1. අඩු මිලට හැකි තරම් භාණ්ඩ ප්‍රමාණයක් තෝරා ගැනීමයි.
   2. භාණ්ඩ පිළිබඳ විශේෂ මිල අඩු කිරීම් වලින් ලබා ගැනීමය.
   3. භාණ්ඩයේ ගුණය ගැන නොතකා මිල අඩු භාණ්ඩ තෝරා ගැනීමයි.
   4. තමා ගෙවන මුදලට තෘප්තියක් ලැබෙන ගුණයෙන් යුතු භාණ්ඩ ලබා ගැනීමයි.

15. ව්‍යාපාර සංවිධාන පෞද්ගලික හා පොදු වශයෙන් වර්ග කරනු ලබන්නේ,
   1. ව්‍යාපාරයේ හිමිකාරිත්වය අනුව
   2. ලාභාලාභ බෙදා ගන්නා ක්‍රමය අනුව
   3. ප්‍රාග්ධනය යෙදවූ ආකාරය මත
   4. කළමණාකාරිත්වයට සහභාගි වන ආකාරය අනුව

16. බලපත්‍රලාභි විශේෂිත බැංකුවකට ගනුදෙනුකරුවන් සඳහා ඉටුකළ නොහැකි කාර්යය වනුයේ,
   1. ණය සැපයීමයි.
   2. විදේශ විනිමය ගනුදෙනු සැලසීමයි.
   3. ඉතුරුම් තැන්පතු බාර ගැනිමයි.
   4. කල්බදු පහසුකම් සැලසීමයි.

17. ශ්‍රී ලංකාවේ සමූපකාර සමිතිවල සේවයේ නියුතු විශාල පිරිසක් සිටිති. ඔවුන්ගේ සේවා ගැටළු පිළිබඳ කටයුතු කරන ආයතනය වන්නේ,
   1. ජාතික සමූපකාර සංවර්ධන ආයතනයයි.
   2. සමූපකාර සේවා කොමිෂන් සභාවයි.
   3. ශ්‍රී ලංකා ජාතික සමූපකාර මණ්ඩලයයි
   4. සමූපකාර කළමණාකරණ ආයතනයයි.

18. ව්‍යවසායකත්වය යනු,
   1. අවදානම් දරමින් ව්‍යාපාරික කටයුතු මෙහෙයවීමයි.
   2. නවෘතා සම්පදනයත්, ව්‍යාපාර අවස්ථා හඳුනාගෙන ඒවායේ නියලීමත්ය.
   3. උත්සහයෙන් හා කැපවීමෙන් ව්‍යාපාර කටයුතු වල නියලීමයි.
   4. භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය යන සාධක වලින් උපරිම ප්‍රයෝජන ගැනිමට කටයුතු කිරීමයි.

19. කොටස් වෙළෙඳ පොල කටයුතු විධිමත් කරමින් තරුවිකාර සමාගම් වලින් ආයෝජකයින්ට සිදුවිය හැකි මූල්‍යමය පාඩු වලක්වා ගැනිමට රජයෙන් පත් කළ බලධාරී ආයතනය වනුයේ.
   1. සුරකුම්පත් හා විනිමය කොමිසම
   2. කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරු මධ්‍යස්ථානය
   3. මධ්‍යම තැන්පතු ක්‍රමය
   4. ශ්‍රී ලංකාවේ සුරැකුම්පත් කොමිෂන් සභාව

20. සාමාන්‍ය කොටස්වල හිමි ප්‍රතිලාභයක් නොවන්නේ,
   1. අයිතිවාසිකම් නිකුතුව
   2. ප්‍රසාද කොටස් නිකුතුව
   2. ප්‍රථමයෙන් ලාභාංශ ලැබීම.
   4. ප්‍රාග්ධන ලාභ ලැබීම.

21. පොදු ජ'නලයේ ඇතුලත් කළයුතු ගනුදෙනුවකි.

1. ආපසු එවන ලද භාණ්ඩ
2. විකිණීම සඳහා ණයට ගත් බඩු
3. වැටුප් ගෙවීම
4. කාර්යාල ප්‍රයෝජනය සඳහා ණයට ගත් ලී බඩු

22. මුදල් පොත සංශෝධනය කිරීමේ දී බැංකු ප්‍රකාශණයෙන් උපුටාගත යුතු අයිතමයන් වන්නේ,

1. තැන්පත් කර ඇති නමුත් නිශ්කාශණය නොවූ චෙක්පත්
2. ස්ථාවර නියෝග මත බැංකුව කර ඇති ගෙවීම්
3. නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක්
4. බැංකු සැසඳුම් විස්තරයේ සටහන්

23. චෙක්පතක් බැංකුවෙන් මුදල් කර ගැනීමට අදාල සටහන

1. බැංකු හර මුදල් බැර
2. මුදල් හර බැංකු බැර
3. මුදල් හර චෙක්පත් බැර
4. ගැනිලි හර බැංකු බැර

24. ගෙවූ ගෙවල් කුලි ගිණුම හර 300, අවිනිශ්චිත ගිණුම බැර 300 යනුවෙන් ද්විත්ව සටහන යෙදීමට හේතුව,

1. ලැබූ ගෙවල් කුලී ගිණුම 300 වැඩියෙන් බැර කර තිබීමයි.
2. ගෙවූ ගෙවල් කුලි ගිණුම 300 අඩුවෙන් හර කර තිබිමයි
3. ගෙවල් කුලි වියදම් සම්පූර්ණයෙන්ම පොත් වලින් අත්හැර තිබීමයි.
4. ගෙවල් කුලි ගෙවීම රු. 150 ගිණුම් වල සටහන් වීම.

25. ණයගැතියකුගෙන් ලැබුණු රු. 5,000 ඔහුගේ ගිණුමේ හරට පිටපත් කිරීමේ වරද නිවැරදි කිරීම සඳහා කල යුතු සටහන,

1. ණයගැති ගිණුම හර 5,000, මුදල් බැර 5,000
2. ණයගැති හර 10,000, අවින්ශ්චිත බැර 10,000
3. මුදල් හර 5,000, ණයගැති බැර 5,000
4. අවිනිශ්චිත හර 10,000, ණයගැති බැර 10,000

26. මුදල් පොතේ බැංකු තීරුවේ බැර ශේෂයෙන් පිළිඹිබු වන්නේ,

1. ව්‍යාපාරිකයාගේ නමින් බැංකුවේ ඇති ශේෂයයි.
2. බැංකු ජංගම ගිණුමේ ඇති වාසි ශේෂයයි.
3. ව්‍යාපාරිකයාගේ ගිණුමේ ඇති අයිරාවයි.
4. ව්‍යාපාර ලාච්චුවේ මුදල් නොමැති බවයි.

27. මුදල් වට්ටම් වලට අදාල වාක්‍යය තෝරන්න.

1. ගිණුම් පොත් වල සටහන් නොකරයි.
2. ද්විත්ව තීරු මුදල් පොතේ සටහන් කරයි.
3. වෙළෙඳ වට්ටම් ලෙසද හඳුන්වයි.
4. දුන් වට්ටම් හා ලද වට්ටම් යනුවෙන් වර්ග දෙකක් වේ.

28. ඉඩමක් මිලදී ගැනිමට වැය වූ ඔප්පු ගාස්තුව විවිධ වියදම් ගිණුමට හර කිරීම,

1. හිලව් දෝෂයකි.
2. මූලධර්ම දෝෂයකි.
3. ඌනතා දෝෂයකි
4. අතිරික්තතා දෝෂයකි.

29. වත්කමක් වැඩිවී ආදායම ද වැඩි වේ යන පිළිතුර ලැබෙන ගනුදෙනුව,

1. ණයට බඩු ගැනිම
2. අත්පිට මුදලට බඩු ගැනිම.
3. මිත්‍රයකුට දුන් ණය මුදල සඳහා පොළී ලැබීම.
4. රක්ෂණ ගාස්තු ගෙවීම.

30. පොදු කාර්ය පිරිවැය යනුවෙන් අදහස් කරන්නේ පහත අයිතමයන්ගේ එකතුවයි.

1. ඍජු ද්‍රව්‍ය, ඍජු ශ්‍රමය හා ඍජු වෙනත් වියදම්
2. වක්‍ර ද්‍රව්‍ය, වක්‍ර ශ්‍රමය හා වක්‍ර වෙනත් වියදම්
3. වක්‍ර ද්‍රව්‍ය හා ඍජු ද්‍රව්‍ය
4. ප්‍රාථමික පිරිවැය හා ඍජු ද්‍රව්‍ය පිරිවැය.

31. ව්‍යාපරයක සුළු මුදල් අග්‍රිමය රු. 1,000 කි. ජනවාරි මස වැය වූ සුළු මුදල් ප්‍රමාණය රු. 881 කි. ප්‍රධාන මුදල් භාරකරුගෙන් ප්‍රතිපූරණය සඳහා ලබා ගත යුතු මුදල වන්නේ,

1. රු. 119
2. රු. 881
3. රු. 1,119
4. රු. 1,881

32. ගිණුම් තැබීමේ ප්‍රයෝජනය වඩාත් නිවැරදි ලෙස දැක්විය හැක්කේ කවරකින් ද?

1. අයිතිකරුගේ හිමිකම දැන ගැනීමට
2. වත්කම්, වගකීම් ප්‍රමාණය දැන ගැනිමට
3. නිවැරදි කළමණාකරන තීරණ ගැනීමට
4. ලාභ බෙදීමට

33. නිකුත් කළ චෙක්පතක් අගරු වීමට අදාල ද්විත්ව සටහන,

1. අගරු වු චෙක්පත් ගිණුම හර, බැංකු බැර වශයෙනි.
2. බැංකු හර, අගරු වු චෙක්පත් ගිණුම බැර වශයෙනි.
3. ණයහිමි ගිණුම හර, බැංකු ගිණුම බැර වශයෙනි.
4. බැංකු ගිණුම හර, ණයහිමි ගිණුම බැර වශයෙනි.

34. වැරදි ද්විත්ව සටහන හඳුනා ගන්න.

1. අයිතිකරු පෞද්ගලික ප්‍රයෝජනයට ගත් භාණ්ඩ - ගැනුම් ගිණුම හර, ගැනිලි ගිණුම බැර
2. මුදල් ගෙවීම - වියදම් ගිණුම හර, මුදල් ගිණුම බැර.
3. ආපසු එවුම් - ආපසු එවුම් ගිණුම හර, ණයගැති ගිණුම බැර
4. රක්ෂණ ගාස්තු වැඩිපුර ගෙවීම - අවිනිශ්චිත ගිණුම හර, රක්ෂණ ගිණුම බැර

35. ආපසු යැවුම් පොතේ එකතුව ලෙජරයට පිටපත් කරන ද්විත්ව සටහන,

1. ආපසු යැවුම් හර, ආපසු එවුම් බැර
2. ආපසු යැවුම් හර, ණයහිමි ගිණුම බැර
3. ණයහිමි ගිණුම හර, ආපසු යැවුම් ගිණුම බැර.
4. ආපසු යැවුම් බැර, ණය ගැති ගිණුම හර

36. ගනුදෙනුකරුවෙකු විසින් ආපසු එවන ලද භාණ්ඩ සඳහා නිවැරදි ද්විත්ව සටහන කුමක් ද?

1. ගැනුම් ගිණුම හර, ගනුදෙනුකරුගේ ගිණුම බැර
2. ගැනුම් ගිණුම හර, ආපසු එවුම් ගිණුම බැර
3. ආපසු එවුම් ගිණුම හර, ගැනුම් ගිණුම බැර
4. ආපසු එවුම් ගිණුම හර, ගනුදෙනුකරුගේ ගිණුම බැර

37. රජයේ දෙපාර්තමේන්තු භාණ්ඩ මිලට ගැනීමේ දී අනුගමනය කරන ක්‍රමයකි,

1. වෙන්දේසි ක්‍රමය
2 ටෙන්ඩර් ක්‍රමය
3. කුලිපිට ගැනුම් ක්‍රමය
4. විලම්භිත ක්‍රමය

❖ 38, 39, 40 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී පහත සඳහන් සංකේත උපයෝගි කර ගන්න.

(A) උපයෝගී පොත් (B) මුදල් පොත (C) ලෙජරය (D) පොදු ජ'නලය

38. කිසියම් ව්‍යාපාරයක් එහි ගනුදෙනු සාරාංශ කර වර්ග කර ගිණුම් ගත කිරීමට භාවිත කරන්නේ,

1. A ය.
2. B ය.
3. C ය.
4. D ය.

39. ණයට ගත් ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් මූලික සටහන් වාර්තා කරන්නේ මේවායින් කවරක ද?

1. A ය.
2. B ය.
3. C ය.
4. D ය.

40. ලදුපත්, ඉන්වොයිසි, වවුචර ආදී මූලාශ්‍ර ඉවහල් කර ගනිමින්, ව්‍යාපාරයක් ගනුදෙනු ප්‍රථමයෙන් වාර්තා කරන්නේ මේවායින් කවරක ද?

1. A ය.
2. B ය.
3. C ය.
4. D ය.